# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1972/31 - 2016 ජූනි මස 22 වැනි බදාදා - 2016.06.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා වන මා විසින් 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 117(2)(ඩ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පනවනු ලබන රෙගුලාසි.

නිමල් සිරිපාල ද සිල්වා,(පා.ම.)
ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍ය.

2016 ජූනි මස 20 වැනි දින,
ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය,
සෙත්සිරිපාය - II අදියර, බත්තරමුල්ල.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ (BIA), මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ (MRIA) සහ රත්මලාන ගුවන් තොටුපොළ (RMA) හැර ශ්‍රී ලංකාව තුළ පිහිටි අනෙකුත් ගුවන් තොටුපොළ සියල්ල පාවිච්චි කිරීම සඳහා අදාළ වන ගාස්තු යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි අතර, ජූලි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

2. මෙම රෙගුලාසි මගින්, 2002 නොවැම්බර් මස 12 වැනි දින අංක 1262/5 දරන *අති විශෙෂ ගැසට් නිවේදනයෙහි* පළ කරන ලද රෙගුලාසි සංශෝධනය විය යුතු ය.

3. ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදා විසින් මෙහෙයවනු ලබන ගුවන් යානා හැර අනෙකුත් සියළුම ගුවන් යානා අදාළ වන අවස්ථාවන්හි මෙහි පහත 6 වැනි ඡේදයෙහි සඳහන් ගාස්තු ගෙවිය යුතු ය.

4. මෙහි ඉහත 3 වැනි ඡේදයෙහි සඳහන් විධිවිධාන නොසලකා, සන්නද්ධ හමුදා විසින් මෙහෙයවනු ලබන ගුවන් යානා සහ ශ්‍රී ලංකා රජය විසින් පාවිච්චි කරනු ලබන ගුවන් යානා නිරත වන්නේ මගීන් සහ නැව්බඩු කුලියක් සඳහා හෝ කිසියම් ප්‍රතිලාභයක් සඳහා හෝ ප්‍රවාහනය කිරීමට වන අවස්ථාවන්හි අදාළ වන පරිදි 6 වැනි ඡේදයේ සඳහන් ගාස්තු ගෙවිය යුතු ය.

5. මෙම ගාස්තු 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ විධිවිධාන යටතේ අමාත්‍යවරයා විසින් පත්කරන ලද, ගගන යාත්‍රාංගන සේවා සපයන සේවා සැපයුම්කරුට ගෙවිය යුතු ය.

6. අදාළ ගාස්තු

6.1 ගොඩබෑමේ ගාස්තු

| *ගුවන් යානයේ බර* | *නව ගොඩබෑමේ ගාස්තු* |
|---|---|
| කි.ග්‍රෑ. 10,000 දක්වා | කි.ග්‍රෑ. 1,000 කට රු. 200.00 |
| කි.ග්‍රෑ. 10,000 සිට කි. ග්‍රෑ. 20,000 දක්වා | රු.2,000.00 + කි.ග්‍රෑ. 10,000 ඉක්මවූ සෑම කි.ග්‍රෑ. 1,000 ක් සඳහා රු. 300.00 |
| කි.ග්‍රෑ. 20,000 ට වැඩි | රු.5,000.00 + කි.ග්‍රෑ. 20,000 ඉක්මවූ සෑම කි.ග්‍රෑ. 1,000 ක් සඳහා රු. 500.00 |

* සියළුම පුහුණු පියසරයන්ගෙන් ඉහත කී ගාස්තු ප්‍රමාණයන්ගෙන් සියයට 50 ක් අයකළ යුතු ය.

1A - G 23683 — 08 (2016/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

6.2 නිවාස ගාස්තු :
සෑම පැය 24 ක් සම්පූර්ණ කාල පරිච්ඡේදයක් සහ ඉන් කොටසක් සඳහා ගොඩබෑමේ ගාස්තුවෙන් සියයට පනහක් (50%) බැගින්

6.3 ගාල් කිරීමේ ගාස්තු :
ගාල් කිරීමේ ප්‍රථම පැය තුන (03) ඉක්මවා ගිය සෑම පැය තුන (03) ක කාල පරිච්ඡේදයක් සහ ඉන් කොටසක් සඳහා ගෙඩබෑමේ ගාස්තුවෙන් සියයට දහය (10%) බැගින්

සටහන

(i) ගාල් කිරීමේ කාල පරිච්ඡේදය ගණනය කිරීම සඳහා, ගතවන නියම කාලය නොතකා ගාල් මඩුවේ සිට ඉගිලුම් ලක්ෂ්‍යය දක්වා ටැක්සි ධාවන කාලය වශයෙන් විනාඩි 15 ක සම්මත කාලයක් එකතු කළ යුතු ය.

(ii) ගාස්තු අයකළ යුතු ගාල් කිරීමේ කාලය ගණනය කිරීම සඳහා පැයකින් කොටසක් ආසන්නතම පැයට රවුම් කළ හැකි ය. එකිනෙක ගාල් කිරීමේ කාල පරිච්ඡේද සඳහා අය කරනු ලබන ගාස්තු ප්‍රමාණය ආසන්න රුපියලට රවුම් කළ හැකි ය.

(iii) නැව් බඩු මෙහෙයුම් සඳහා වන ගොඩබෑමේ ගාස්තු ප්‍රමාණයන් මඟී මෙහෙයුම් සඳහා වන ගාස්තු ප්‍රමාණයන්ට සමාන වේ.

(iv) සෑම අවස්ථාවකදීම ගුවන් යානයේ සම්පූර්ණ බර ආසන්න කි. ග්‍රෑ. 1,000ට ගණනය කරනු ලබන අතර, ගාස්තු ප්‍රමාණයන් ආසන්න රුපියලයට ගණනය කරනු ලැබේ.

6.4 පර්යන්ත ගාස්තු :

අයකරනු ලබන ගොඩබෑමේ ගාස්තුවෙන් සියයට පහකි (5%).

07 - 370

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.